00027

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2015

ළමා අයිතිවාසිකම් – ESU3130

කාලය : පැය (03) තුනයි.

---

දිනය - 2015 අප්‍රේල් 08 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් පිළිබඳව වර්ෂ 2000 න් පසු ක්‍රියාත්මක කරන ලද පනත් හතරක් (04) ක් නම් කරන්න.

02. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියෙහි (CRC) දක්වා ඇති අයිතිවාසිකම් කාණ්ඩ හතර කවරේ ද?

03. ළමයාගේ “වර්ධනය” හා “සංවර්ධනය” යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

04. විශේෂිත තත්ත්වයේ පසුවන දරුවන් උදෙසා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය මගින් සපයා ඇති සේවාවන් මොනවා ද?

05. ශ්‍රී ලංකාවේ ජීවත්වන ආබාධිත ළමයින්ට ආධාර කිරීම සඳහා ගත හැකි උපාය මාර්ග පහක් (05) සඳහන් කරන්න.

06. නිදහසින් පසුව ළමයින්ගේ අධ්‍යාපන අයිතිය සුරැකීම සඳහා ශ්‍රී ලංකා රජයන් මගින් ගෙන ඇති වැදගත් පියවර පහක් (05) ලියන්න.

07. ළමා අයිතිවාසිකම පිළිබඳ දැනුවත්භාවය ඉහල නැංවීමේදී මාධ්‍යවල පවතින දුර්වලතා හතරක් (04) නම් කරන්න.

08. පාසල් ක්‍රීඩා පිටියේ දී ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගුරුවරයෙකුට දැරිය හැකි වගකීම් පහක් (05) ලියන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවැති රජයයන් ළමා හා මාතෘ රැකවරණය සඳහා ගෙන ඇති වැදගත් පියවර පහක් (05) ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

(ii) එම පියවරවල ඔබ දකින දුර්වලතා තුනක් (03) කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 06)

(iii) ඔබ ඉහත සඳහන් කළ එක් එක් දුර්වලතාව අවම කර ගැනීමට එක් යෝජනාවක් බැගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 09)

10. (i) "ශ්‍රී ලංකාවේ පූර්ව යටත් විජිත යුගයේ ළමා අයිතිවාසිකම්වල තත්ත්වය" පිළිබඳ සුදුසු නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

(ii) ළමා අයිතිවාසිකම් පිළිබඳව පෘතුගීසි හා ලන්දේසි යුගයන් හි ශ්‍රී ලංකාව තුළ පැවැති තත්ත්වය කෙබඳු වේද ? (ලකුණු 10)

11. (i) මෑත කාලීනව ශ්‍රී ලංකාව තුළ ළමයින් අවතැන්වීමට හේතු වූ සාධක මොනවා දැයි කෙටියෙන් පෙන්වා දෙන්න. (ලකුණු 05)

(ii) එසේ අවතැන් වූ දරුවන්ගේ මූලික අයිතිවාසිකම් පිළිබඳ තත්වය කෙබඳු වේදැයි කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාව තුළ දැනට ජීවත්වන අවතැන් වූ ළමයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 10)

12. (i) ළමා අපයෝජනය යනු කුමක්දැයි හඳුන්වා දෙමින් ඒ සඳහා බලපාන ප්‍රධාන සාධක තුනක් (03) සුදුසු උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(ii) ශ්‍රී ලංකාව තුළ ළමා අපයෝජනය වළක්වා ගැනීමට ගත හැකි ක්‍රමෝපායයන් පහක් (05) සඳහන් කර ඉන් එකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. "ළමයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමෙහි ලා සෑම ගුරුවරයෙකුටම නෛතික බලයක් මෙන් ම භෞතික වගකීමක් ද ඇත." ඔබ මෙම වගන්තියට එකඟ වේ ද? කාලීන නිදසුන් දක්වමින් විමසන්න.

(ලකුණු 20)

14. පහත සඳහන් මාතෘකා අතුරින් ඕනෑම දෙකක් (02) සඳහා සටහන් ලියන්න.

(i) අයිතිවාසිකම් දරන්නා වශයෙන් ළමයාගේ පුද්ගල අනන්‍යතාව

(ii) ළමයින් සතු සහභාගිත්ව අයිතිය

(iii) ශ්‍රී ලංකාවේ ළමා සුරක්ෂණ අධිකාරිය

(iv) ළමා අයිතිවාසිකම වෙනුවෙන් පූජ්‍ය පක්ෂයේ භූමිකාව

(ලකුණු 10 x2 = 20)

හිමිකම් ඇවිරිණි.